**ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ අරමුදල**

**පොදු උපදෙස්**

ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ අරමුදල සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2010 මාර්තු මස 30 වන දින වේ. මෙම වසර සඳහා තේමාව වනුයේ ***"සංවර්ධනය සහ කාළගුණික විපර්යාස - ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ ප්‍රජා නම්‍යශීලිත්වය ගොඩනැංවීම"*** යන්නයි.

**වැඩසටහන පිළිබඳව**

ලෝක බැංකු රාජ්‍ය කාර්යයාල මඟින් ලබාදෙනු ලබන සුළු ආධාර ප්‍රදානයන් සැපයීම මඟින් ප්‍රජා කටයුතු වලට අදාළ ක්‍රියාකාරකම් සඳහා සිවිල් සමාජ අරමුදල හෙවත් CSF (මීට ප්‍රථම සුළු ආධාර වැඩසටහන) උපකාර කරයි.

සිවිල් සමාජ අරමුදල මඟින් සංවර්ධන ප්‍රතිඵල වලට බලපෑම් කරන සහ ඒවා වැඩි දියුණු කරන ප්‍රාරම්භකයන් ගැනීම සඳහා පුරවැසියන්ට හැකිවන සහ ඔවුන්ව බලාත්මක කරන ක්‍රියාකාරකම් වලට මුල පිරීම සහ ආධාර කිරීම සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාකාරකම්, අන්තර්ගත කිරීම, වගකීමට ඇති හැකියාව සහ සහභාගීත්වය සඳහා වන යාන්ත්‍රණ ශක්තිමත් කරයි. තවද මෙම ක්‍රියාකාරකම් රාජ්‍ය අංශය, අනෙකුත් සිවිල් සමාජ සංවිධාන සහ පෞද්ගලික අංශය සමඟ හවුල්කාරීත්වයන් ශක්තිමත් කිරීමට ද ඉවහල් වේ.

**ඔබ අයදුම් කිරීමට පෙර**

සිවිල් සමාජ අරමුදලට හැකියාව ඇත්තේ ලැබෙන අයදුම්පත් වලින් ඉතාම සුළු ප්‍රතිශතයකට පමණක් අරමුදල් ලබා දීමටයි. බොහෝ ඉල්ලීම් නොසලකා හැරීමට හේතුව වනුයේ ඒවා දක්ෂතාවයෙන් අඩු වීම නොව ඒවා තෝරා ගනු ලැබූ යෝජිත ව්‍යාපෘති මෙන් සිවිල් සමාජ අරමුදලෙහි නිර්ණායකයන් හෝ වර්තමාන අරමුණු සමඟ හෝ නොගැලපීමයි. ඔබගේ ක්‍රියාකාරකම අරමුණු සමඟ හෝ නිර්ණායක සමඟ අනුකූල විය හැකි නමුත් ප්‍රදානය කිරීමට ඇති මුදල් ප්‍රමාණය අභිබවා ඒ සඳහා වන ඉල්ලුම වැඩි විය හැක. අයදුම් කිරීමට පෙර, ගැලපීමක් ඇත්දැයි සොයා බැලීමට දී ඇති උපදෙස් කියවීමට කරුණාකර කාලය ගන්න.

**අයදුම් කළ හැක්කේ කාටද?**

සංවර්ධන ගැටලු පිළිබඳ කටයුතු කරන ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන

සිවිල් සමාජ සංවිධාන මනා ස්ථාවරත්වයක් සහිත, සමාජය තුළ ඉලක්ක සපුරා ගත් බවට වාර්තාවක් සහ මුල්‍යමය විශ්වාසවන්ත භාවයකින් යුතු විය යුතුය;

පෙර වසර වලදී මෙම වැඩසටහන මඟින් ආධාර නොලැබූ සංවිධාන වලට ප්‍රමුඛතාවය දෙනු ඇත. වසර  පහක කාලයක් තුල සිවිල් සමාජ අරමුදල මඟින් ආධාර ප්‍රදානයන් තුනකට වඩා මෙම සංවිධානවලට ලබා ගත නොහැක.

**කුමන ආකාරයේ ක්‍රියාකාරකම් සඳහා ආධාර කරනු ලබන්නේද?**

ප්‍රජා කටයුතු ඇතුළත් ක්‍රියාකාරකම් සඳහා ආධාර කිරීම සිවිල් සමාජ අරමුදලෙහි මූලික අරමුණ යි. සෑම වර්ෂයකදීම ශ්‍රී ලංකාව තුළ ලෝක බැංකුව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන අනුපූරණය කිරීම සඳහා යම් තේමාවක් තෝරා ගනු ලබයි.

මූ.ව.2010 සඳහා තේමාව වනුයේ ***"සංවර්ධනය සහ කාළගුණික විපර්යාස - ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ ප්‍රජා නම්‍යශීලිත්වය ගොඩනැංවීම"*** යන්නයි. 2010 සිවිල් සමාජ අරමුදල ගෘහස්ථ මට්ටමේ තිරසාර කෘෂිකාර්මික ක්‍රමවේදයන්, ජල කළමනාකරණය සහ ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සහ වෙනත් එවැනි ක්‍රියාත්මකවීම් වලට අදාළ ප්‍රජා පාදක ප්‍රාරම්භකයන් තුළින් කාළගුණික විපර්යාසයන්ට අනුගත වීමේ සහ ඉන් ඇතිවන බලපෑම සමනය කිරීමේ නව්‍ය යාන්ත්‍රණ යෝජනා කරනු ඇති ව්‍යාපෘති සඳහා උපකාර වනු ඇත.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනයේ නියුතු ප්‍රධාන භූමි ප්‍රදේශයක් ද වන වියළි කලාපයේ පවතින ජල හිඟය උතුරු, නැගෙනහිර සහ ගිණිකොණ දිග ප්‍රදේශ වල ජීවත් වන ජනයා මුහුණ දෙන විශාලතම අභියෝගයක් ලෙස හැදින්විය හැකි වේ. කාළගුණික විපර්යාස ඇති වීමේ දී මෙම භූගෝලීය ප්‍රදේශයන් හී සංවර්ධනය සහ දුගී බාවය අවම කිරීම වැළැක්විය හැකි ආහාර නිෂ්පාදනය සහ සීමිත ජල සම්පත් යන අභියෝගයනට මුහුණ දීම සඳහා ව්‍යාපෘති සකස් කිරීමට 2010 සිවිල් සමාජ අරමුදල අවධානය යොමු කරනු ඇත.

**ඊට අමතරව :**

මෙම ක්‍රියාකාරකම් වලට, ප්‍රජා කටයුතු පිළිබඳ කුසලතා සහ/හෝ දැනුම වැඩි දියුණු කිරීමට වැඩමුළු සහ සම්මන්ත්‍රණ; ප්‍රතිපත්ති සම්පාදනය හෝ රාජ්‍ය සේවා බෙදාහැරීම සඳහා බලපෑම් කිරීමට සුදුසු සන්නිවේදන වැඩසටහන්; හෝ අදාළ අංශයෙහි වපසරිය ගොඩනැගීමට නව්‍ය ජාලකරණයන් අන්තර්ගත වන නමුත් මේවාට පමණක් සීමා නොවේ.

අදාළ කටයුත්ත ආධාර මුදල ප්‍රදානය කළ දින සිට වසරක කාලයක් තුළ සම්පූර්ණ කළ යුතුය.

**කුමන ආකාරයේ ක්‍රියාකාරකම් වලට ආධාර නොකරන්නේද?**

සිවිල් සමාජ අරමුදල මඟින්, පර්යේෂණ වැඩසටහන්, විධිමත් උසස් අධ්‍යාපන පුහුණු වැඩසටහන්, මෙහෙයුම් ව්‍යාපෘති, දැනට පවත්වා ගෙන යනු ලබන ආයතනික හර ආධාර (ක්‍රියාකාරීත්වයට අදාල නොවන උපකරණ වැනි) ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, අධ්‍යාපන වැඩසටහන්, තමන් විසින් තමන් සඳහා අයදුම් කරන පුද්ගලයින් හෝ නීතිමය නොවන වපසරීන් වෙත ආධාර ප්‍රදානය කළ නොහැකි බව කරුණාවෙන් සලකන්න.

යෝජිත ක්‍රියාකාරකම්, සාමාන්‍ය ලෝක බැංකු ක්‍රමෝපායයන් සමඟ තරඟ කිරිම හෝ ඊට ආදේශකයක් ලෙස කටයුතු කිරිම නොවිය යුතුය; ලෝක බැංකුවේ සමාන්‍ය වැඩසටහන් වලින් ඒවා පැහැදිලිව වෙන් කළ හැකිවිය යුතුය.

**කුමන ප්‍රමාණයේ ආධාර ප්‍රදානයන් කරනු ලබන්නේද?**

එක් ව්‍යාපෘතියක් සඳහා ලබා දෙන ආධාර ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 9000 ක් දක්වා උපරිමයකි. 2010 සිවිල් සමාජ අරමුදල විසින් ව්‍යාපෘති යෝජනා 5 ක් සඳහා ආධාර ප්‍රදානය කරනු ලැබේ. ව්‍යාපෘතියෙහි සම්පූර්ණ පිරිවැයෙන් කොටසක් පමණක් මෙම ආධාරයෙන් ආවරණය විය යුතු අතර, වෙනත් මූලාශ්‍ර වලින් අතිරේක ප්‍රදානයන් ලබා ගැනීමට එම ආධාර මුදල උපකාරී වනු දැකීමට ලෝක බැංකුව කැමති වේ.තමන් හට වෙනත් සංවර්ධන පාර්ශවකරුවන් වෙතින් පරිපූරක අරමුදල් ලබා ගැනීමට ලෝක බැංකුව විසින් සිදු කරනු ලබන ප්‍රදානයක් කෙසේ උපකාර වේ දැයි විස්තරයක් ඉදිරිපත් කරන ලෙස අයදුම් කරන සංවිධාන වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය කරනු ලබන සමස්ත වියදමෙන් අවම වශයෙන් සියයට 20 ක ප්‍රමාණයක් වත් අයදුම් කරනු ලබන සංවිධානය විසින් මුදල් හෝ වෙනත් ඊට සමාන ආකාරයකින් තම යෝජිත අයවැයෙන් පෙන්නුම් කළ යුතුවේ.

**ආධාර ප්‍රදානය කරනු ලබන්නේ කෙසේද?**

ලෝක බැංකු කොළඹ කාර්යයාලයේ නිලධාරී මණ්ඩලයෙන් සහ ජාත්‍යන්තර ජල කළමණාකරණ ආයතනයේ සහ ජාත්‍යන්තර මූල්‍ය සංගමයේ (IFC) තාක්ෂණික විශේෂඥයන්ගෙන් සැදුම් ලත් කමිටුවක් මඟින් අයදුම්පත් පරීක්ෂා කර බලා ඇගයීමට ලක් කෙරේ. අවශ්‍ය නිර්ණායකයන් සපුරා ඇත්දැයි සොයා බැලීමට සහ එය තහවුරු කිරීමට අයදුම්පත් පරීක්ෂා කර බැලේ. තෝරා ගන්නා අයදුම්පත් කිහිපයක් පමණක් රාජ්‍ය අධ්‍යක්ෂකගේ අවසන් තීරණය ලබා ගැනීම වෙත යොමු කෙරේ. ලෝක බැංකුවේ තීරණය පිළිබඳව අනුමැතිය ලත් ව්‍යාපෘති යෝජනා සහිත අයදුම් කරන ලද සංවිධාන වෙත ඊ - මේල් මඟින් දන්වනු ලැබේ.

සිවිල් සමාජ අරමුදල් කණ්ඩායම සියලු ව්‍යාපෘති යෝජනා මාසයක පමණ කාලයක් මිඩංගු කොට ඉතා හොඳින් සමාලෝචනය කරනු ඇත. ප්‍රදානලාභීන් විසින් ලෝක බැංකු කාර්යාලයට එවනු ලබන අති විශාල අයදුම්පත් ප්‍රමාණය අනුව පෞද්ගලික හමුවීම් සහ දුරකතන ඇමතුම් සඳහා අනුබල දෙනු නොලැබේ.

**අයදුම්පත් ඇගයීමට ලක් කරනුයේ කෙසේද?**

ව්‍යාපෘති යෝජනා ඇගයීමේදී සිවිල් සමාජ අරමුදල් කමිටුව මෙම ප්‍රශ්න පිළිබඳ අවධානය යොමු කරයි.

ගැටලුව මායිමේ සිටින සහ අනතුරට භාජනය විය හැකි කණ්ඩායම් බලාත්මක කිරීම අරමුණු කොට ගත් ප්‍රජා කටයුතු වෙනුවෙන් වූ ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රදානය භාවිතා වේද?

තොරතුරු ව්‍යාප්තිය,සංවාදය සහ ජාලකරණය ප්‍රවර්ධනය සඳහා වන ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රදානය භාවිතා වේද?

යෝජිත ක්‍රියාකාරකම වැදගත් ප්‍රශ්න සහ ගැටලු පිළිබඳ කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය නායකයන් සතු බලය වර්ධනය කරන්නේද?

යෝජිත ක්‍රියාකාරකම මඟින් ප්‍රයෝජනවත් සංවාද සහ/ හෝ තොරතුරු ව්‍යාප්තිය සඳහා පහසුකම් සලසමින්,කාන්තාවන්, ළමුන්, තරුණ කොටස් සහ ශාරීරික දුබලතා සහිත පුද්ගලයන් ද ඇතුලුව විවිධ පාර්ශ්වකරුවන් අතර හවුල්කාරීත්වය ප්‍රවර්ධනය සහ බලගැන්වීම සිදු කළ හැකිවේද?

ව්‍යාපෘති යෝජනාව සතුව පැහැදිලිව දක්වන ලද අරමුණු, ක්‍රියාකාරකම්, ප්‍රතිඵල සහ තිරසාර භාවය සඳහා වූ යාන්ත්‍රණ වේද?

මෙම ප්‍රදානය යම් විශේෂිත ක්‍රියාකාරකමක් සඳහා බලාපොරොත්තු වේද?

යෝජිත ක්‍රියාකාරකම ආධාර මුදල ප්‍රදානය කළ දින සිට වසරක කාලයක් තුළ සම්පූර්ණ කරනු ඇත්ද?

යෝජිත ක්‍රියාකාරකම වෙනත් ආධාර ලබා දෙන්නන් සහ මූලාශ්‍ර මඟින් ආධාර උපකාර ලබන්නේද?

යෝජක සංවිධානය වෙත මීට ඉහතදී ලබා දී ඇති ප්‍රදානයන් (ලෝක බැංකුව හෝ වෙනත් ආධාර ලබා දෙන්නන් විසින්) නිසි පරිදි භාවිතා කොට ඇත්ද?

යෝජක සංවිධානය තමන් සතු හැකියාව ප්‍රදර්ශනය කොට හෝ යෝජිත ක්‍රියාකාරකම කළමණාකරණය කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේ දී පෙන්වා ඇත්ද?

යෝජක සංවිධානය වෙත සුළු ආධාර වැඩසටහන වෙතින් මෑතක දී ආධාර ප්‍රදානයක් ලබා තිබේ ද? (වසර පහක කාලයක් තුල සිවිල් සමාජ අරමුදල මඟින් ආධාර ප්‍රදානයන් තුනකට වඩා මෙම සංවිධානවලට ලබා ගත නොහැක.)

**ආධාර ප්‍රදානයක් සඳහා අයදුම් කරන්නේ කෙසේද?**

සිවිල් සමාජ අරමුදල , ලෝක බැංකු කොළඹ කාර්යයාලය මඟින් පරිපාලනය වේ.

උපදෙස් සහ අයදුම්පත්‍ර ලෝක බැංකු කොළඹ කාර්යයාලයේ විමසීම් කවුළුවෙන් හෝ ඉහත වෙබ් සම්බන්ධකය හරහා ලබා ගත හැකි වේ.

අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර අයදුම්පත්‍රය සහ නිර්ණායකයන් විමසිල්ලෙන් කියවා බැලීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. ව්‍යාපෘති යෝජනා කෙටි,ඉතා නිවැරදි ඒවා විය යුතු අතර ඇමිණුම් හැර පිටු හතරකට(04) නොවැඩි විය යුතුය. පිටු හතරකට වැඩි ව්‍යාපෘති යෝජනා ප්‍රතික්ෂේප වීමේ ඉඩකඩ පවතී. සම්පූර්ණ ඇමිණුම් සහිත ව්‍යාපෘති යෝජනා පමණක් සමාලෝචනය කරනු ඇත.

**අයදුම්පත්‍ර යොමු කිරීම :**

ඊ - මේල් මඟින් : infosrilanka@worldbank.org

එසේ නොමැති නම්:
සිවිල් සමාජ අරමුදල

දිලිනිකා පීරිස් මිය බාරේ

ලෝක බැංකු කාර්යයාලය කොළඹ

**අයදුම්පත් 2010 මාර්තු මස 30 වන දිනට පෙර ලැබීමට සලස්වන්න.**